# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 3 දරන
# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජනවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 50යි.

# 1982 අංක 3 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 14/81.

## 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1982 අංක 3 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

11අ වන අලුත් වගන්තිය 1980 අංක 46 දරන පනතෙහි ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියෙහි 11අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

" අමාත්‍ය වරයාගේ විධාන.

11අ. මේ පනත යටතේ මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට ලිඛිතව පොදු හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ඉවත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" 1958 අංක 15 දරන පනත අදාළ වන ඇතැම් සේවා යෝජකයන් විසින් ගෙවිය යුතු දායක මුදල්.

17. (1) මේ පනතේ 29 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අදාළ වන සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ එක් එක් සේවා නියුක්තයා සම්බන්ධයෙන් ඒ පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදලට හෝ ඒ පනත යටතේ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් වශයෙන් ප්‍රකාශ කරන ලද අර්ථසාධක අරමුදලකට ඒ පනත යටතේ නියම කර ඇති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිශතයක් අනුව ගණන් බලනු ලැබූ ප්‍රමාණයක දායක මුදලක් ගෙවීමට ඒ සේවායෝජකයා විසින් ඒ පනතේ 11 වන වගන්තියේ විධිවිධාන යටතේ තෝරා ගෙන ඇති අවස්ථාවක ඒ ප්‍රතිශතය—

2—ඒ 59547—14,650(81/11)

(අ) ඒ සේවායෝජකයා යටතේ වූ තම සේවා නියුක්තියෙන් ඒ සේවා නියුක්තයාගේ එක් මාසයක මුළු ඉපයීම්වලින් සියයට තුනකට සමාන වෙතොත් හෝ ඊට වැඩි වෙතොත් ඒ වැඩි ප්‍රතිශතයෙන් සියයට තුනක් සෑම මාසයකදී ම අඩුකර ඒ සියයට තුන මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට ප්‍රේෂණය කළ හැකි ය; තව ද ඒ අඩු කිරීමෙන් පසු ඉතිරි වන ප්‍රමාණය සේවක අර්ථසාධක අරමුදලට හෝ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලට ගෙවීම කරගෙන යා හැකි ය; නැතහොත්

(ආ) ඒ සේවායෝජකයා යටතේ වූ තම සේවා නියුක්තියෙන් ඒ සේවා නියුක්තයාගේ එක් මාසයක මුළු ඉපයීම්වලින් සියයට තුනකට අඩු වෙතොත් එම පනතේ 10 වන වගන්තියේ නියමිත ප්‍රතිශතයට වැඩියෙන් ඇති මුදල් ප්‍රමාණය සහ, ඒ සමග, ඒ ඉපයීම්වලින් සියයට තුනක මුළු එකතුවක් සෑදෙන පරිදි ඒ සේවා යෝජකයා විසින් දෙනු ලබන්නා වූ අතිරේක දායක මුදලක් ඒ සේවා යෝජකයා විසින්, මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය හැකි අතර, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියමිත ප්‍රමාණය සේවක අර්ථ සාධක අරමුදලට හෝ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලට ගෙවීම දිගටම කර ගෙන යා හැකිය.

(2) මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට (1) වන උපවගන්තිය ප්‍රකාර සේවා යෝජකයකු විසින් කරන ලද යම් ගෙවීමක් 16 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ප්‍රතිලාභ ගෙවනු ලබන කාලය.

21. (1) අරමුදලේ යම් සාමාජිකයකුගේ පුද්ගලික ගිණුමේ බැරට ඇති යම් මුදලක් අරමුදල පිහිටුවීමේ දින සිට අවුරුදු දෙකක් ඉකුත් වන තුරු ගෙවනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු දෙකක කාලය ඉකුත් වීමෙන් පසු, යම් සාමාජිකයකුගේ පුද්ගලික ගිණුමේ බැරට ඇති මුළු මුදල්

ප්‍රමාණය, 23 වන, 24 වන සහ 25 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව ඒ සාමාජිකයාට ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ සියරට යවනු ලබන යම් සාමාජිකයකුගේ පුද්ගලික ගිණුමේ බැරට ඇති මුළු මුදල් ප්‍රමාණය ඒ සාමාජිකයා ශ්‍රී ලංකාවෙන් පිටත් වන දිනයට පෙර ඔහුට ගෙවනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද අතහැර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඒ දායක මුදල දින දහයක් නොඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහක අධිභාරයක් ;

(ආ) ඒ දායක මුදල දින දහයක් ඉක්මවන, එහෙත් එක් මාසයක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහළොවක අධිභාරයක් ;

(ඇ) ඒ දායක මුදල එක් මාසයක් ඉක්මවන, එහෙත් මාස තුනක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) ඒ දායක මුදල මාස තුනක් ඉක්මවන, එහෙත් මාස හයක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) ඒ දායක මුදල මාස හයක් ඉක්මවන, එහෙත් මාස දොළහක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට හතළිහක අධිභාරයක් ;

(ඊ) ඒ දායක මුදල මාස දොළහක් ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක අධිභාරයක්.".

7. මේ පනතේ 4 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1981 මාර්තු 1 වනදා සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. 4 වන වගන්තිය අතීතයට බලපාන අයුරු ක්‍රියාත්මකවීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.